**ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 09 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 09 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විදුලි පද්ධතියේ දෝෂයක් හේතුවෙන් 2023 ජනවාරි 24 දින සිදු වූ හානිය සම්බන්ධයෙන් සිදු කළ මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාවට අනුව රු. 1,150,332 ක අලාභ හානි වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | තොරතුරු කැඳවීමේදි හා ඉදිරිපත් කිරීමේදී සිදු වී ඇති සන්නිවේදන දෝෂ නිසා අතපසුවීමකින් මෙම අලාභය මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කිරීමට නොහැකි වී ඇති බව. | පාඩු හා අත්හැරීම් නිවැරදිව ගණනය කර හෙළිදරවු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වංචනික ස්වරූපයේ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. 93,421,253 ක පිරිවැයක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | වැඩ බිමේ කැණීම් කරන ලද පස් ප්‍රවාහනය සඳහා එක් ඝන මීටරයක් සඳහා සියයට 11 බැගින් ලාභප්‍රතිශතයක් වැඩිපුර එකතු කර පස් ඝන මීටර් 4,847.74 ක් ප්‍රවාහනය වෙනුවෙන් රු. 226,098 ක් හා කොන්ක්‍රීට් කණු ඉදිකිරීමට මිලි මීටර් 32 ක වට ප්‍රමාණයෙන් හා මිලි මීටර් 300 ක ගැඹුරු සහිතව ගල් සිදුරු කර යකඩ කම්බි | මෙම නිවැරදි කිරීම ඊළඟ අත රැඳවුම් මුදල් නිදහස් කිරීමේදී අඩු කරන බව. | සම්මත ගොඩනැගිලි මිල රේටයන්ට අනුව නිවැරදිව රේටයන් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යෙදීම වෙනුවෙන් සියයට 9 ක ලාභ ප්‍රතිශතයක් වැඩියෙන් එකතු කර රු. 57,940 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. | | |
| (ii) | ඉදිකිරීම් භූමියෙහි කඩා ඉවත් කළ කළුගල් ඝන මීටර් 278.15 ක් පරිපාටියකින් තොරව හා අනුමැතියකින් තොරව බැහැර කර රු. 78,627 ක අලාභයක් සිදු කර තිබුණි. | වැඩබිමේ ගොඩ ගසා තිබූ කළු ගල් කියුබ් 102 ප්‍රමාණයක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කියුබ් 1ක් රු.800 බැගින් වෙන්දේසි කළ බව. | ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර බැහැර කළ යුතුය. |
| (iii) | 2019 සම්මත ගොඩනැඟිලි මිල රේට (BSR) විග්‍රහය අනුව කළුගල් කැඩීමට අදාළ යන්ත්‍ර උපකරණ ප්‍රවාහනය සඳහා කි.මී.25 ක් දක්වා ගෙවිය හැකි උපරිම ප්‍රවාහන ගාස්තුව රු. 29,700 ක් වුවත් උපකරණ ප්‍රවාහනයට රු. 755,745 ක් ගෙවීම් කර තිබීම හේතුවෙන් රු. 726,744 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මේ සම්බන්ධව පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට ස්වාධීන කමිටුවක් පත් කර ඇති බව. | සම්මත මිල රේට අනුව ඇස්තමේන්තු කර ගෙවීම් කළ යුතුය. |
| (iv) | 2010 ඔක්තෝබර් 20 දිනැති අංක 02/06/02/09/(viii) – GSMD දරන පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයට අනුව බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ඉදිකිරීම් භූමියේ කැණීම් කරන ලද පස් කියුබ් 1713 ක් ඉදිකිරීම් භූමියෙන් පිටතට ප්‍රවාහනය කර තිබුණි. ඒ හේතුවෙන් පස් කියුබ් 1713 ක් සඳහා රු. 188,085 ක බලපත්‍ර ආදායමක්ද අහිමි වී තිබුණි. | මේ සම්බන්ධව පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට ස්වාධීන කමිටුවක් පත් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිල පියස රජයේ නිවාස සංකීර්ණයේ II අධියරේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ වැඩ විෂයන් 07 ක ඉටු නොකළ වැඩ කොටස් වෙනුවෙන් එකතුව රු. 112,208 ක් ගෙවීම් කර තිබුණි. | මෙහිදී ගෙවීම් කිරීමේ දෝෂයක් සිදු වී ඇති බව පිළිගන්නා අතර කළු ගල් බැම්මෙහි 5.82 $m^3$ ක් වෙනුවෙන් ගෙවීම් නොකිරීම නිසා මූල්‍යමය අලාභයක් සිදු වී නොමැති බව. | ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ නොකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2021 දෙසැම්බර් 15 දිනැති අංක ME/NPP/02/2021 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුව පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතියට අනුව වසම් 02 ක පරීක්ෂාවට ලක් කළ ප්‍රතිලාභීන් 10 ක ගෙන් ප්‍රතිලාභීන් දෙදෙනෙකුගේ රු. 366,000 ක් වැය කර ඉදිකර තිබුණු ගෘහ තුළ මල් පැළ වගා කර නොතිබුණු අතර, රු. 1,281,000 ක් වැය කර ඉදිකර තිබුණු ප්‍රතිලාභීන් 07 කගේ ගෘහ තුළ සුළු වශයෙන් ඇන්තූරියම් පැළ වගා කර තිබුණත් එම පැළ අලෙවි කිරීමක් සිදු කර නොතිබුණි. | කාර්යාලයෙන් ලබා දෙන උපදෙස් වලට අනුව ක්‍රියා නොකරන ප්‍රතිලාභීන් හඳුනාගෙන ඔවුන්ගේ සෙවන ගෘහ මල් වගා කිරීමට වසමේ කැමැත්තක් දක්වන වෙනත් ප්‍රතිලාභීන්ට ලබා දීමට කටයුතු කරමින් පවතින බව. | සම්පත් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ පරීක්ෂාවට භාජනය වූ පොල්ගස් ආශ්‍රිත කර්මාන්තයේ ප්‍රතිලාභීන් 13 ක්, බිම්මල් වගාව ආශ්‍රිතව ප්‍රතිලාභීන් 08 ක් හා පැළ තවාන් ආශ්‍රිත කර්මාන්තයේ යෙදෙන ප්‍රතිලාභීන් 08 කගෙන් පිළිවෙලින් ප්‍රතිලාභීන් 10 ක්, 04 ක් හා 06 ක් හෙවත් සියයට 77 ක්, සියයට 50 ක් හා සියයට 75 ක ප්‍රමාණයක් එම කර්මාන්තයෙන් ඉවත් වී තිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හා ඉන්පසු ඇති වූ ඉන්ධන අර්බුදය වැනි දැඩි ආර්ථික අර්බුද තත්වය හමුවේ ව්‍යාපෘති අපේක්ෂිත මට්ටමින් සිදු කරගෙන යාමට නොහැකි වී ඇති බව. | අදාළ ව්‍යාපෘති ඵලදායීව පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වර්ෂයේ ක්‍රියාත්මක ගම සමඟ පිළිසඳරක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උඩවැලිකැටිය වසමේ ප්‍රතිලාභීන් 15 ක් සම්බන්ධ කර ගෙන ඇඟලුම් කම්හලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. 667,075 ක් වැය කර ජුකී මැෂින් 15 ක් මිලදීගෙන තිබුණි. ඇඟලුම් කම්හලක් ඉදිකිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් වුවද, එක් එක් පුද්ගලයාට වෙන වෙනම ජුකී මැෂින් බෙදා දී තිබුණු අතර පරීක්ෂාවට ලක් කළ ප්‍රතිලාභීන් 08 දෙනෙකු මෙම ජුකී මැෂින් උපයෝගී කරගෙන ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන බවක් නිරීක්ෂණය නොවුණි. | පොදු ස්ථානයක් නොමැති වීම හේතුවෙන් ඇගලුම් කම්හලක් ආරම්භ කිරීමට නොහැකි වී ඇති බව. | සැළසුම් කළ ව්‍යාපෘති ඵලදායීව පවත්වාගත යුතුය. |
| (ඇ) | 2021 ජූලි 15 දිනැති අංක SMR/P/DEV(v)/10/03/2021 (පොදු) දරන එක් ගමකට එක් ව්‍යවසායකයෙකු බිහි කිරීමේ ව්‍යාපෘතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක ඇඟළුම්, වඩු, ඇඹරුම්, කොම්පොස්ට්, බිම්මල් වැනි ක්ෂේත්‍ර වෙනුවෙන් ප්‍රතිලාභීන් 89 ක් තෝරාගෙන රු. 8,049,708 ක් වැය කර තිබුණි. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ පැවති දුර්වලතා හේතුවෙන් පරීක්ෂාවට ලක් කළ ප්‍රතිලාභීන්ගෙන් සියයට 67 ක සිට සියයට 100 ක් අතර පරාසයක ව්‍යාපෘති අසාර්ථකව හා මන්දගාමීව පැවතුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදී ගැටළුකාරී තත්වයන් ඇති වූ බැවින් ව්‍යාපෘති අක්‍රිය වූ නමුත් මේ වන විට අවශ්‍ය පසු විපරම් කටයුතු සිදු කරන බැවින් ක්‍රමයෙන් ව්‍යාපෘති සක්‍රිය මට්ටමට ලඟා වන බව. | සම්පත් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ඈ) | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල පියස රජයේ නිවාස සංකීර්ණයේ වහලයේ 2021 වර්ෂයේ රු. 1,400,000 ක් වැය කර කිලෝවොට් 4.08 ක | මේ වන විට දෛනිකව සිදුවන විදුලි ජනන ඒකක ගණන අප විසින් නිරීක්ෂණය කරන නිසා බිඳ වැටීමක් හෝ දෝෂයක් ඉතා ඉක්මනින් දැන ගැනීමේ ක්‍රමයකට යොමු වී ඇති බවත් | සම්පත් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| සූර්ය බල විදුලි පද්ධතියක් සපයා සවි කර වසර 02 ක කාලයක් ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සූර්ය බල පද්ධතියෙන් ජනනය වන කි.වො.4.08 ක විදුලිය අලෙවි කර ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට සියලු දෝෂ නිවැරදි කර ඇති බැවින් අපේක්ෂිත අරමුණ ඉටු වන බව. | |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රජයේ නිවාසයක් හා පස්බාගේ කෝරළේ, මිනිපේ හා අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 හි වටිනාකම් හඳුනාගෙන නොමැති පරිගණක හා උපාංග 05 ක්, හා විදාතා මධ්‍යස්ථානවල ඇති ස්වයං රැකියා යන්ත්‍ර උපකරණ 07 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 14 ක් අතර කාල පරාසයක් තුළ අදාළ විදාතා මධ්‍යස්ථාන තුළ නිෂ්කාර්යව පැවතුණි. | පස්බාගේකෝරළේ හා මිනිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2009 වර්ෂයේ ලැබී තිබුණු උපකරණ යල්පැනගිය තාක්ෂණයකින් යුතු බව. ඉදිරි ක්‍රියාමාර්ග කර්මාන්ත අමාත්‍යාංශයෙන් විමසීමට කටයුතු කළ බව හා උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රජයේ නිවාසය නිලධාරීන්ගේ ඉල්ලීම මත භාවිතා කිරීමේ හැකියාව ඇති බව. | සම්පත් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

## 3.4 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 ජනවාරි 27 දිනැති EST/8/ALLOW/03/121 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව, අය වැය යෝජනා මත ග්‍රාමීය මට්ටමෙන් සංවර්ධන ව්‍යාපෘති 2022 අප්‍රේල් මාසයෙන් පසුව ක්‍රියාත්මක නොවී පැවතියදී 2022 අප්‍රේල් 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය | නිලධාරීන් සඳහා ග්‍රාමීය මට්ටමේ සංවර්ධන වැඩ සටහන් සම්බන්ධීකරණය වෙනුවෙන් දීමනා ගෙවීම සඳහා EST/8/ALLOW/03/121 හා 2014 ජනවාරි 27 දිනැති ලිපිය අනුව සිදු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක නිලධාරීන් 20 ක් වෙත රු. 2,084,000 ක විශේෂ දීමනා ගෙවා තිබුණි. | | |
| (ආ) | ඉකුත් වර්ෂයේ මාර්තු මස රු. 923,205 ක් වැය කර අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පේෂකර්ම මධ්‍යස්ථානය අලුත්වැඩියා කර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් ගොඩනැගිල්ල අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීම වෙනුවෙන් භාවිතයට ගෙන නොතිබුණි. | විලාන පල්ලේගම වසමේ දැනට පවතින පේෂකර්ම ගොඩනැගිල්ලේ පේෂකරම ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා මධ්‍යම පළාත් සභාවේ පේෂකරම දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බව. | ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයට යොදවා ගත යුතුය. |
| (ඇ) | පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඇඟලුම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2022 වර්ෂයේ රු. 905,758 ක මුදලක් වැය කර පල්ලිය කොටුව පාර පාසල් ගොඩනැගිල්ල අලුත්වැඩියා කර 2018 වර්ෂයේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු මහන මැෂින් මෙම ගොඩනැගිල්ලට ගෙනවිත් ගබඩා කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් මැහුම් කර්මාන්තය ආරම්භ කර නොතිබීම හේතුවෙන් මහන මැෂින් හා ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි. | ඇඟළුම් කර්මාන්තය ආරම්භ කිරීමට පෙර එම ස්ථානයේ ආරක්ෂාවට ආරක්ෂිත වැටක් ඉදිකිරීම හා සනීපාරක්ෂක පහසුකම් හා ජල පහසුකම් සපයා ගැනීම අවශ්‍ය බව. | නිවැරදිව සැළසුම් කර ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. |
| (ඇ) | පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පල්ලේගම ප්‍රදේශයේ නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම වෙනුවෙන් රු. 1,873,064 ක් වැය කර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද සමාලෝචිත | එම මහලට ප්‍රවිශ්ඨවීමේ මාර්ගය ඉතා පටු බැවින් හා මාර්ගයට ප්‍රදර්ශනය නොවීම මත අලෙවි මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාමට නුසුදුසු බව. | නිවැරදිව ශක්‍යතා අධ්‍යනයක් කර පූර්වයෙන් සැළසුම් කර ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ අවසන් දින වන විටත් ගොඩනැගිල්ල අරමුණුගත කාර්යය සඳහා යොදවාගෙන නොතිබුණි. | | |
| (ඉ) | අයවැයෙන් වැඩ ලක්ෂයක් වැඩසටහන යටතේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩහේන කහටගස්තැන්න වසා දමා ඇති පාසල් ගොඩනැගිල්ල ඉකුත් වර්ෂයේදී රු. 1,200,000 ක් වැය කර සංවර්ධනය කර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇහලුම් ආශ්‍රිත කුඩා කර්මාන්ත ශාලා පිහිටුවීම වෙනුවෙන් 2017 වර්ෂයේ ලැබී තිබුණු යන්ත්‍ර හා උපකරණ උපයෝගී කර ගෙන ඇඟළුම් කම්හලක් ආරම්භ කිරීමට සැළසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ඇහලුම් කම්හලක් ආරම්භ කර නොතිබීම හේතුවෙන් අදාළ උපකරණ හා ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වූ බවත් ප්‍රතිපාදන ලද පසු ඉදිරි කටයුතු සිදු කිරිමට නියමිත බව. | ශක්‍යතා අධ්‍යනයක් කර ව්‍යාපෘති නිවැරදිව සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඊ) | 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ මිනිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බුලත්වැල්කඳුර ග්‍රාමනිලධාරී වසමේ අඩු ආදායම්ලාභී පවුල් 33 ක් කේන්ද්‍ර කර ගනිමින් පිටි ඇඹරුම් කර්මාන්තයක් ආරම්භ කිරීම සඳහා පිටි සැකසුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම, විජලන යන්ත්‍රයක් හා ප්‍රතිලාභීන් 33 ක් වෙත පිටි ඇඹරුම් යන්ත්‍ර 33 ක් ලබා දීම වෙනුවෙන් රු. 4,652,567 ක මුදලක් වැය කර තිබුණි. 2024 පෙබරවාරි 27 දින සිදු කළ භෞතික පරීක්ෂාව අනුව පිටි | ප්‍රතිලාභීන් 33 දෙනෙකු සඳහා ගෘහස්ථ පිටි සැකසුම් යන්ත්‍ර ලබා දී ඇති නමුත්, ව්‍යාපෘතිය සැළසුම් කරන ලද්දේ, ප්‍රතිලාභීන් නිවසේ සිට සහල් පිටි නිෂ්පාදනය කර පිටි එක් රැස්කරන මධ්‍යස්ථානයට ගෙන ඒමෙන් අනතුරුව විජලන යන්ත්‍රයෙන් වියලා කල්තබා ගතහැකි ආකාරයට වෙළඳපොලට සැපයීමයි. නමුත් එසේ නොවීම හේතුවෙන්, ගෘහස්ථව සවිකළ යන්ත්‍ර වෙත අසල් වාසීන් රැගෙන එන සහල්, ධාන්‍ය පමණක් අඹරා දීම නිසා ඔවුන් මාසිකව රු.800 පමණ ආදායම් ලබා ගන්නා බව. | සම්පත් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

සැකසුම් මධ්‍යස්ථානයේදී අදාළ විජලන කටයුතු සිදු නොවන බව නිරීක්ෂණය වූ අතර, ඒ වෙනුවෙන් දරන ලද රු. 2,920,067 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

## 3.5 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක විශ්‍රාමිකයන් 209 ක් වෙත වර්ෂ 01 ක සිට වර්ෂ 19 ක් අතර කාල පරාසයක් තුළ මූලික වැටුප් හා ජීවන වියදම් දීමනාව වශයෙන් රු. 55,001,651 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර ඉන් රු. 28,702,753 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අය කර නොතිබුණි. | වැඩිපුර ගෙවීම් අතරින් සියයට 75ට වැඩි ප්‍රමාණයක් හමුදා විශ්‍රාම වැටුප් ගෙවීමේදී සිදු වූ දෝෂයන් බවත් ඒ පිළිබඳව යුධ හමුදාපති වෙත දැනුම් දී ඇති බවත් දන්වන අතර අය කිරීම් කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතින බව. | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් වැළැක්වීමට අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමක් කිරීමත්, වැඩිපුර ගෙවීම් හැකි ඉක්මනින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2011 ජූනි 06 දිනැති අංක 05/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව කටයුතු නොකර ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී විදෙස්ගත විශ්‍රාමිකයින්ට ජීවන වියදම් දීමනාව හා විශේෂ දීමනාව ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක විශ්‍රාමිකයන් 118 කට රු. 3,310,244 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක විශ්‍රාමිකයන් 79 දෙනෙකුගෙන් රු. 1,587,895 ක මුදලක් අය කර ගත යුතුව පැවතුණි. | මේ වන විට විදේශගත විශ්‍රාම වැටුප් නවතා ඇති නමුත් ඔවුන් ඉදිරියේදී ලංකාවට ආ පසු විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීමේදී මෙම අයවීම් කරනු ලබන බව. | වැඩිපුර ගෙවීම් වැළැක්වීමට අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමක් කිරීමත්, වැඩිපුර ගෙවීම් හැකි ඉක්මනින් නිරවුල් කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක ඉඩම් අත්පත් කර ගැනීමේ හා ඉඩම් පැවරීමේ කටයුතු සම්බන්ධයෙන් ලිපිගොනු 350 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී ගොනු ආරම්භ කර වර්ෂ 03 ක සිට වර්ෂ 40 ක් අතර කාලයක් ගත වී තිබුණත් ඉඩම් අත්පත් කර ගැනීමේ හෝ ඉඩම් පැවරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ හා ඉඩම් පැවරීමේ කටයුතු සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන් සම්බන්ධ වන බැවින් මෙම කටයුතු ප්‍රමාද වී ඇති බව හා අදාළ පාර්ශ්වයන් දැනුවත් කර අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරිමට කටයුතු කරන බව. | ඉඩම් පැවරීමේ හා අත්පත් කර ගැනීමේදී මතුවී ඇති ගැටළු හඳුනාගෙන ඒවා නිවැරදි කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | මහනුවර දිස්ත්‍රික්කයේ නාය යෑම් අධි අවදානම් තත්ත්වයන් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක පවුල් 1845 ක් හඳුනාගෙන තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට පවුල් 1386 ක් අධි අවදානම් ප්‍රදේශයේම පදිංචි වී සිටින බවට නිරීක්ෂණය විය. | දීර්ඝ කාලයක් අදාළ ස්ථානවලට කිසිදු ආකාරයේ ආපදා තත්වයක් ඇති නොවූ බැවින් හා ඔවුන්ගේ ජීවනෝපාය කටයුතු අදාළ පදිංචි ප්‍රදේශය ආශ්‍රිතව සිදුකරගන්නා බැවින් එම නිවාසවලින් ඉවත්වීමට අකමැති බව ප්‍රතිලාභීන් ප්‍රකාශ කර ඇත. ඒ අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත මේ පිළිබඳ නැවත සමීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා ඇති බව. | නැවත පදිංචි කිරීමේදී මතුවන ගැටළු හඳුනාගෙන එම ගැටළුවලට පිළියම් ලබා දෙමින් පුද්ගලයන්ගේ ජීවිත අවදානම වැළැක්වීමට පියවර ගත යුතුය. |
| (ඉ) | 2021 අගෝස්තු 27 දින අනතුරට ලක්ව තිබුණු තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථය සම්බන්ධයෙන් සිදු කළ මු.රෙ. 104 (4) පරීක්ෂණ වාර්තාවට අනුව එහි රියදුරුගෙන් රු. 84,444 ක් අය කිරීමට නිර්දේශ කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් එය අය කර නොතිබුණි. | මු.රෙ 101(4) පරික්ෂණ වාර්තාව අනුව අලාභය රියදුරුගෙන් අය කළ යුතු වුවත් සේවය හැර ගොස් ඇති මෙම රියදුරු හා ඔහුගේ බිරිඳ විදේශගත වී ඇති බැවින් අලාභය අය කර ගත නොහැකි වී ඇති බව. | අදාළ මුදල් කඩිනමින් අයකර අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි 2023 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව, තත්‍ය සේවක සංඛ්‍යාව හා සැසඳීමේදී පුරප්පාඩු 376 ක් හා අතිරික්ත 362 ක් පැවතුණි. | අතිරික්තය හා පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට හා මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට දන්වා ඇති බව. | අතිරික්ත නිලධාරීන් හා සම්බන්ධ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමටත්, පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |